පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
12

# අවසාන වාර පරීක්ෂණය - 2019
## සිංහල - II පත්‍රය

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................ කාලය : පැය 03 යි.

## I කොටස

- **I කොටසෙහි 01 ප්‍රශ්නය ද II කොටසෙහි 2, 3 ප්‍රශ්න ද ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **01 ප්‍රශ්නයේ ඇති සියලු ම අනු කොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- **I කොටස II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාර දෙන්න.**

01. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1 කණ්ඨතාලුජ අක්ෂර පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

1. උ ඌ ප
2. ක ච ත
3. එ ඒ ඓ
4. ඔ ඕ ඖ
5. ය ර ල ( )

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

1. වලාකුල , සීඝ්‍රගාමී , මර්ධනය , විස්මය , දෘෂ්ටි විශේෂඥ
2. වලාකුළ , සීඝ්‍රගාමී , මර්දනය , විශ්මය , දෘෂ්ටි විශේෂඥ
3. වලාකුළ , ශීඝ්‍රගාමී , මර්දනය , විශ්මය , දෘෂ්ඨි විශේෂඥ
4. වලාකුළ , ශීඝ්‍රගාමී , මර්දනය , විස්මය , දෘෂ්ටි විශේෂඥ
5. වලාකුළ , ශීඝ්‍රගාමී , මර්ධනය , විශ්මය , දෘෂ්ටි විශේෂඥ ( )

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

1. කාව්‍යශේඛරය, ගුත්තිලය, සසදාවත, පූජාවලිය
2. අමාවතුර , කව්සිළුමිණ , බුත්සරණ , රාජාවලිය
3. බුත්සරණ , අමාවතුර , ධර්ම ප්‍රදීපිකාව , සද්ධර්මාලංකාරය
4. සඟරාජවත , මොරතොටවත , දම්සරණ , තුන්සරණ
5. අමාවතුර , සඟරාජවත , බුත්සරණ , ධර්ම ප්‍රදීපිකාව ( )

1.4 පහත සඳහන් වරණ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. සියලුම විභක්ති සමග සමාස සිදුවේ.
2. ලු යනු අවධාරණාර්ථයේ නිපාතයකි.
3. මුලිනුපුටා යන පදය ස්වර සන්ධියට අයත් වේ.
4. "දැමිඳුරු" යන වචනය විශේෂණ සමාස පදයකි.
5. "කුකුළා" යන පදයට සරණැවි යන පදය පර්යාය පදයක් නොවේ. ( )

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

1. ධර්ම ද්වීප , සාහිත්‍ය පොත් , ප්‍රවෘත්ති ඇමති , ග්‍රන්ථ සැලැස්ම
2. ස්තූප වංශය , මූල්‍ය ප්‍රතිපාදන , සෞඛ්‍ය මධ්‍යස්ථානය , ආරක්ෂක අමාත්‍ය
3. රාජ්‍ය අනුග්‍රහය , වංශ කතා , පූර්ව ස්වර , මිශ්‍ර කිරිය
4. විහාර මන්දිරය , රාජ්‍ය සභාව , භාරත දේශය , ඇමති මණ්ඩලය
5. ශීල ව්‍යාපාරය , යෝජනා ක්‍රමය , ලංකා ද්වීපය , බඹ ලෝකය ( )

Education NCP - www.edncp.lk

1.6 තත්සම වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

1. දේශිත , භාෂිත , භාවිත , පාදක
2. මුහුණත , සවනත , අවනත , නුවනත
3. සුන්දර , මන්දිර , ගින්දර , කින්නර
4. සරණ , උපකාර , අපකාර , ප්‍රතිකාර
5. ආලාප , ආහාර , ආකාර , ආලෝක ( )

1.7 තත්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

1. අර්ථ , ධර්ම , මිනිස් , දහම්
2. පෙර , ගම්භීර , මනුෂ්‍ය , දකුණු
3. ප්‍රතිසංස්කරණ , ආඥා , චක්‍රය , සොබාධර්මය
4. අරුත් , ගැඹුරු , පැදකුණු , අබිසෙස්
5. ගදඹ , රාජමාලිගය , දහම් , අභිෂේක ( )

1.8 අවදි කරණ සබඳ හා අදර යන විභක්තිවලට අයත් සමාස පද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

1. කිරිබත් , මිහිදුම් , නයිවිස , වනමල්
2. නයිවිස , වනමල් , කිරිබත් , මිහිදුම්
3. වනමල් , නයිවිස , මිහිදුම් , කිරිබත්
4. කිරිබත් , වනමල් , මිහිදුම් , නයිවිස
5. මිහිදුම් , කිරිබත් , නයිවිස , වනමල් ( )

1.9 කෘදන්තයක් නොවන පදයක් අන්තරගත වරණය තෝරන්න.

1. නටන , ගයන , වයන , බලන
2. මැරුණු , බැලුණු , කැඩුණු , ගැයුණු
3. හාරන , පීරන , තෝරන , සූරන
4. ගෙරවිලි , කෙඳිරිලි , සැනසිලි , වැනසිලි
5. නැටුම් , ගැයුම් , නැටෙන , වැයෙන ( )

1.10 පහත සඳහන් උද්ධෘතවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) සේවකය වහා **එව**
(ආ) ක්‍රීඩකයා ඉදිරියට **පැන පැන** පහර දෙයි
(ඇ) රෝගියා බෙහෙත් **බී** නිදා ගනී.
(ඈ) ඉර **පායද්දී** මල් පිපෙයි.

1. අසම්භාව්‍ය ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , පූර්වක්‍රියා , විධික්‍රියා
2. විධික්‍රියා , මිශ්‍ර ක්‍රියා , අසම්භාව්‍ය ක්‍රියා , පූර්වක්‍රියා
3. විධික්‍රියා , මිශ්‍ර ක්‍රියා , පූර්වක්‍රියා , අසම්භාව්‍ය ක්‍රියා
4. මිශ්‍ර ක්‍රියා , විධික්‍රියා , පූර්වක්‍රියා , අසම්භාව්‍ය ක්‍රියා
5. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා , විධික්‍රියා ( )

1.11 තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. පියාණ , පුතණුවෝ , දියණිය , බෑනණුවෝ
2. ගෞරවතර , ප්‍රියතර , විශිෂ්ටතම , දැවමුවා
3. සිඟිති , කැබලිති , කිනිති , පැණිති
4. ඉහළ , නිහැඬියාව , ලාලිත්‍යය , කුසලතාව
5. අරටු , කැහැටු , සීට්ටු , වකුටු ( )

Education NCP - www.edncp.lk

1.12 උපසර්ගයක් යෙදී නොමැති පදයක් සහිත පද පේළිය තෝරන්න.

1. සුදන , දුදන , විමල , නිර්මල
2. අවමානය , විශිෂ්ට , අපවාද , අතිරස
3. අස්ථිර , අබල , අපල , අල්ල
4. ප්‍රතිඵල , අවගුණ , ප්‍රතිපක්ෂ , අභිධර්ම
5. අතිධාවන , උද්ඝෝෂණ , නිමල , උමග ( )

1.13 නිපාතයන් නොවන පදයක් අන්තරගත වරණය තෝරන්න.

1. නිබඳ , පිණිස , වැළි , පමණ
2. මෙන් , සේ , බඳු , එව්
3. තෙක් , දක්වා , තුරු , පටන්
4. අනේ , තවද , පවා , නිසා
5. හෙවත් , නැටූ , නිති , යළි ( )

1.14 වැහි **ඇඳිරිය** ඇති විට සමහර කුරුල්ලෝ **එකිනෙකා** සිය කැදලි **කරා** පියාඹා යති. යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් වන්නේ , කුමන ව්‍යාකරණ අංග වලට ද?

1. නිපාත , තද්ධිත , සන්ධි
2. සන්ධි , නිපාත , තද්ධිත
3. තද්ධිත , සන්ධි , නිපාත
4. නිපාත , සන්ධි , තද්ධිත
5. තද්ධිත , නිපාත , සන්ධි ( )

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

1. බැලුවේය , තැලුවේය , කෑවාය , බැලිණි
2. නටමින් , ගයගයා , ගොස් , කියත
3. එන්න , අසව් , ගනු , කව
4. බලති , ගයති , ගැයෙති , බැලිණ
5. වැස්සොත් , ලියවයි , ජයවේවා , නටා ( )

1.16 සමාසයක් නොවන පදයක් අන්තරගත වරණය තෝරන්න.

1. අනදර , අනුබල , සුසිරිත් , කුදිටු
2. නිල්මල , පාතඹර , තුන්ලෝ , හිරුරැස්
3. ගල්හිත , පොල්තෙල් , නිහැඬියාව , ගම්වැසි
4. තිසරණ , නවදොර , සුරලොව , බුදු දහම
5. ඉරසඳ , අහසපොළව , තිනෙත් , මලවි ( )

1.17 එකම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

1. දකුණත , සුරත , මැඳගිල්ල , සුරිඳු
2. ගංවෙරළ , කළංදෙක , නෙලුම් මල් , ගිනිකම්
3. මුලසුන , උපනූපන් , සිතියම් , කටුවල
4. කටුවල , නොයෙක් , වීරෝදාර , පිළිතුරු
5. වත්තල , කොග්ගල , රැක්කත්තන , මහේන්ද්‍ර ( )

1.18 ව්‍යාකරණානුකූල ව නොගැළපෙන පදයක් සහිත වරණය තෝරන්න.

1. පුරාතන , නවීන , ලැඳියාව , සාමර්ථ්‍යය
2. වයත , ගයත , කියත , බලත
3. නැටුමන් , ගැයුමන් , වැයුමන් , කියුමන්
4. සෙද , තෙක් , නො , මිස
5. සුන්තුරු , එරුණුහස් , දසබල , කුපුරිස් ( )

Education NCP - www.edncp.lk

1.19 ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.

1. ලේඛකයෙක් වූ ඔහු ගායකයෙක් ද විය.
2. ගොවියන් වනාහි රටට බත සපයන්නෝ වෙති.
3. උගතුන් රට හැර ගොස් ඇත.
4. ක්‍රීඩකයෝ හෙට තරග දිනාවි
5. ඒ ඉන්නේ දක්ෂ ගායකයෙකු ලු ( )

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

1. ඔය සේරම ගෙන යන්න පුළුවන්ද
2. එහෙනම් මම කුඹුරට යන්නම්
3. ගොවියෝ උදෑසනින්ම කුඹුරට යති.
4. මා පාන් අරන් ගෙදර යමි.
5. ඔයා ඉක්මන් කොරලා යන් ( )

(ලකුණු 20)

**02.**

(අ) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"අලංකාර" යන ශබ්දයෙහි අර්ථය ද කලින් කල වෙනස් වූ බව පැරණි පොතපත හදාරන්නෙකුට පෙනීයයි. භාමාභාදීන් මෙම පදය භාවිත කළේ උපමා රූපකාදී අර්ථාලංකාරයන් හා යමක අනුප්‍රාසාදී ශබ්දාලංකාරයනුත් පොදුවේ හඳුන්වන ජාති නාමයක් වශයෙනි. එසේ ද වුවත් , දණ්ඩින්ගේ භාවිතය අනුව මේ පදය මෙයට වඩා බෙහෙවින් පළල් අර්ථයක් දෙයි. කාව්‍යයේ ශෝභාව ඇති කරවන ධර්මයෝ යම්තාක් වෙත් ද ඒ සියල්ලම අලංකාර හැටියට දණ්ඩින් කල්පනා කළේ ය. මෙසේ දණ්ඩින්ගේ ව්‍යවහාරය අනුව උපමා යමකාදී ලක්ෂණ පමණක් නොව ගුණ මාර්ගාදී කාව්‍යාංග ද අලංකාර වශයෙන් හැඳින්විය හැකි වේ. කාව්‍යය පාඨකයාගේ රුචිය දිනා ගැනීමට හේතුගත වන ඕනෑම ලක්ෂණයක් මේ අයුරින් "අලංකාර" යයි කිව හැකි ය. "අලංකාර" යන පදයට වඩාත් පුළුල් අර්ථයක් දුන්නෙකි , වාමන නම් රීති වාදියා . කාව්‍ය වූ කලි අලංකාර මගින් වටහා ගත යුත්තක් ය යනුවෙන් කී වාමන අලංකාර යනුවෙන් අදහස් කළේ කාව්‍ය පුරා පැතිර පවතී සෞන්දර්යය නැතහොත් චමත්කාරයයි. මේ අලංකාරයට (සෞන්දර්යයට) හේතුභූත වන්නේ කාව්‍ය ගුණ විය හැකි යි. නැතහොත් එහි රීතිය විය හැකි යි. නොඑසේ නම් උපමාදි උක්ති ක්‍රමයක් හෝ යමකාදි ශබ්ද ලක්ෂණයක් විය හැකි යි. එසේත් නැත්නම් වෙනත් ඕනෑ ම කාව්‍යාංගයක් විය හැකියි. යම් යම් අවස්ථාවල දී මෙතරම් පෘථුල අර්ථයකින් වහරණ ලැබූ අලංකාර පදය කල්යාමේ දී නැවතත් පටු අර්ථයක් දීම සඳහා භාවිත කෙරිණි පශ්චාත්කාලීන විචාර ග්‍රන්ථවල යළිත් මෙම පදය භාවිත කර ඇත්තේ , අර්ථාලංකාර හා ශබ්දාලංකාර පොදුවේ හඳුන්වන ජාති නාමයක් වශයෙනි. එනම් , භාමහ එම පදය භාවිත කළ අර්ථයෙනි.

i. මේ ඡේදයෙහි "අලංකාරවාදීන්" කී දෙනෙකු ගැන සඳහන් වේ ද ? ඔවුන් නම් කරන්න.

ii. මෙහි දැක්වෙන ආකාරයට " අලංකාර පිළිබඳ පෘථුලතම අර්ථ කථනය ඉදිරිපත් කළේ කවරෙක් ද?

iii. "අලංකාර" පිළිබඳව භාමහ ඉදිරිපත් කරන විවරණය දණ්ඩින් ඉදිරිපත් කරන විවරණයෙන් වෙනස් වන්නේ කවර කරුණු මත ද ?

iv. "අලංකාර" වශයෙන් බලන කල්හි "යමක" හා "රූපක" අතර වෙනස කුමක් ද?

v. මේ ඡේදයෙහි සඳහන් වන "කාව්‍යාංග" දෙකක් නම් කරන්න.

(ලකුණු 2 × 5 = 10)

Education NCP - www.edncp.lk

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

භාෂාඥයන්ගේ ගවේෂණවලට අනුව සිංහල වාක් කෝෂය කෙරෙහි දෙමළ භාෂාව බලපා ඇති අනෙක් ආකාරය වන්නේ සිංහල පොදු ජනතාව හා දෙමළ භාෂකයන් අතර සම්පර්කයයි. මෙම දෙපිරිස අතර සිදු වූ සන්නිවේදනය කරණකොටගෙන බොහෝ දෙමළ වචන සිංහලයට ආනිත වී ඇති බව ඔවුහු පෙන්වා දෙති. තදීය ක්‍රමය ක්‍රි.පූ. යුගයේ පටන් ලාංකේය සමාජය තුළින් විද්‍යාමාන වන බවත් , කලින් කල එය අඩු වැඩි වශයෙන් සිදුවී ඇති බවත් ඔවුහු සඳහන් කරති. දෙමළ භාෂාව ප්‍රධාන කොටගත් ද්‍රවිඩ භාෂා සිංහල සාහිත්‍ය සම්ප්‍රදායටත් , භාෂාවේ - වාග් කෝෂයටත් බලපෑ ප්‍රධානතම හේතුව දකුණු ඉන්දියානු දෙමළ ආක්‍රමණ බව පෙන්වා දිය හැකිය. ක්‍රි.පූ.145 - 101 තෙක් සූසාළිස් වසකින් පරිමිත වූ එළාර පාලන සමය එහිලා විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

තව ද මහා පරාක්‍රමබාහු රජුගෙන් පසු සිංහල රාජ්‍ය පිරිහී ගියේ සියලු වටිනාකම් හා සම්පත් සමඟ ය. චෝළ හා පාඬි ආදී දේශවලින් පැමිණ සිංහල රාජ්‍ය අත්පත්කරගත් දේශපාලකයන් නිසා රටත් , සිංහල වර්ගයාත් භාෂාව හා සාහිත්‍යයත් පිරිහීමට පත්විය. වසංගතයක් මෙන් රට පුරා පැතිර ගිය මෙම ද්‍රවිඩ බලය වඩාත්ම උග්‍ර වූයේ කාලිංග මාඝ නැමති ද්‍රවිඩ පාලකයන් ලංකාව යටත් කරගැනීමෙන් පසුව ය. එබැවින් මේ ආකාරයෙන් සිදු වූ ද්‍රවිඩ ආක්‍රමණ , ඔවුන්ගේ පාලන නිසා ඇති වූ සම්බන්ධතා නිසා දෙමළ සංස්කෘතිකාංග මෙන් ම භාෂාව ද සිංහල සංස්කෘතිය හා භාෂාව කෙරෙහි බලපෑ ඇති බව නො අනුමාන යි.

(ලකුණු 15)

03. දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300 - 350 අතර වනසේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.

1. දිනෙන් දින වැඩිවන අපරාධ වැළැක්වීම.
2. බෝ නොවන රෝග ව්‍යාප්තිය සඳහා හේතුවන වර්තමාන ජීවන රටාව
3. කසළ ප්‍රශ්නය හා පාරිසරික ගැටලු
4. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හා අනාගත අභියෝග
5. රටක සංවර්ධනය කෙරෙහි සමබර වූ විදේශ ප්‍රතිපත්තියක අවශ්‍යතාව

(ලකුණු 25)

04.

(අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

i. වෛද්‍ය සායනයට රෝගීහු පැමිණ ඇත.
ii. කමනීත් මමත් නුවර ගියහ.
iii. ගොවියකු වූ පියදාස ක්‍රීඩකයෙකු ද විය.
iv. මා නිතරම රූපවාහිනිය බලමියි අම්මා බනියි.
v. ගම්පෙරළිය ලිව්වේ මාර්ටින් වික්‍රමසිංහයන් ය.

(ආ) පහත සඳහන් වාක්‍යය කර්මකාරකයට හරවන්න.

i. ගුරුතුමා මාද නංගීද අනතුරින් බේරා ගත්තේ ය.
ii. දෙමාපියෝ දරුවන් යහමග යවති.
iii. ඔවුහු මා පසසති
iv. සාමාජිකයෝ නව ලේකම්වරියක පත්කර ගත්හ.
v. සොර මුළ ළමයකු පැහැර ගත්හ.

Education NCP - www.edncp.lk

(ඇ) නිවැරදි වාක්‍ය නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

i. (කවියෝ / කවියන්) වනාහි රස ඇති ලොවක් (මවන්නෝ / මවන්නන් ) යැයි පිළිගැනීමක් පවතී.

ii. (මිනිසුන් / මිනිස්සු) වැඩට එතියි (දෙමාපියන් / දෙමාපියෝ ) පවසති.

iii. (ගේ හිමියෝ / ගේ හිමියන්) රූපවාහිනිය නරඹද්දී (සොරු / සොරුන් ) ගෙට ඇතුළු වූහ.

iv. (වෛද්‍යවරු / වෛද්‍යවරුන්) නිතරම ( රෝගීන් / රෝගීහු ) සමඟ සුහදශීලීව කථා කරති.

v. අපට හොඳ (පුහුණුකරුවෙකු / පුහුණුකරුවෙක් ) රගර් ක්‍රීඩාව සඳහා ( ලැබෙත්වා / ලැබේවා )

(ලකුණු 15)

05.

(අ) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. අනු අංකය දක්වන්න.

i. **පුරාතන** සිංහල **සාහිත්‍ය උදෙසා** ලේඛකයෝ විශාල සේවයක් කළ හ.

( පුරාතන - තද්ධිත , සාහිත්‍ය - තද්ධිත , උදෙසා - නිපාත )

ii. **මුදළිඳු කිරිබත්** පුදා **තෙරුවන්** වැන්දේ ය.

( මුදළිඳු - සන්ධි , කිරිබත් - සමාස , තෙරුවන් - සමාස )

iii. අහසේ **ගෙරවිලි** හඬ **ඇසෙද්දී සියොත්හු** කැදලි කරා පියාඹා ගියහ.

( ගෙරවිලි - කෘදන්ත , ඇසෙද්දී - ක්‍රියා , සියොත්හු - විභක්ති )

iv. **කොස්දෙල්** මෙන් **ම ඉන්නල** ද ගෙවතුවල වගා කෙරේ.

( කොස්දෙල් - සමාස , ම - නිපාත , ඉන්නල - සන්ධි )

v. **ඇසළ පොහොය** නිමිත්තෙන් දර්ශනීය **තොරණක් ඉදිකර** ප්‍රදර්ශනය කරන ලදී

( ඇසළ පොහොය - සමාස , තොරණක් - තද්ධිත , ඉදිකර - ක්‍රියා )

(ලකුණු 15)

06.

(අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතරින් තෝරා ලියන්න.
( අපවාද / පරිවර්තන / ආශ්චර්ය / අවවාද / ඓශ්වර්ය / අනුවාදය )

i. සද්ධර්මරත්නාවලිය ධම්ම පදට්ඨ කතාවේ ............................. කි.

ii. සිංහල සංස්කෘතියෙහි ඇති වූ .......................... ඒ ඒ යුග ඇසුරෙන් හඳුනාගත හැකිය.

iii. ගුරුන්ගේ .......................... සිසු දරුවෝ පිළි ගනිති.

iv. සිල්වත්හු අනුනට .......................... නොකරති.

v. සීගිරිය .......................... දනවන ඉපැරණි බල කොටුවකි.

vi. ශ්‍රී ලංකාවේ පුරාණ අගනගර ....................... සම්පන්න විය.

(ලකුණු ½ x 6 = 03 )

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| i. | අමාත්‍ය + අංශය | ii. | ගුරු + උපදේශ | iii. | දෙ + අගසව් |
| iv. | ක්‍රීඩා + උත්සවය | v. | පංච + ඉන්ද්‍රිය | vi. | සුර + අඟන |

(ලකුණු ½ x 6 = 03 )

(ඇ) පහත දක්වා ඇති තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්තිය නම් කරන්න.

i. **දෙමාපියනි** , ඔබ ඔබේ දරුවා ගැන උනන්දුවන්නැයි **විදුහල්පතිතුමා** කීවේ ය.

ii. **නිමාලිගේ** බෑගය තාත්තා ගෙන **තුෂාරිට** දුන්නේ ය.

iii. **කම්කරුවා** උදෙන් නැගිට **කෙක්කෙන්** අඹ කඩයි.

(ලකුණු ½ x 6 = 03 )

Education NCP - www.edncp.lk

(ඈ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

i. මට නෙමෙයි මල්ලියේ තියෙන වෙලාවක ඕං එය නගාලට අඳින්න මුකුත් ගෙනත් දීපං
ii. මල් උයනට ළං වත් ම ඇයට නව පණක් ලැබිණි ඕ ඇස පිසුවා ය.
iii. පුත මා කිවාක් අසන්න.

(ලකුණු 1 x 3 = 03 )

(ඉ) පහත දැක්වෙන ප්‍රකාශනවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

i. "මං අද තැපැල් කන්තෝරුවට යනවා"යි පියසේන කීවේ ය.
ii. "වන සතුන්ට හානි නොකරන්නැයි" පරිසර නිලධාරීහු පැවසූහ.
iii. "අපි අපේ ගම හැදුවේ හරියට මහන්සි වේලා" යි ගම්වැසියෝ ඇමතිතුමාට පැවසූහ.

(ලකුණු 1 x 3 = 03 )

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තදීය **සම්බන්ධතා** ඔස්සේ දෙමළ වචන විශාල වශයෙන් සිංහලයට එකතුවන්නට ඇති බව අනුමාන කළ හැකි ය. වාග්විද්‍යාඥයින් පෙන්වා දෙන ආකාරයට උක්ත සාධක සිංහල භාෂා වාග් කෝෂිය අංශයට මතු නො ව සමස්ත සිංහල භාෂා සංස්ථිතියට ම එක සේ බලපා ඇත. එනම් සිංහල භාෂාවේ ශබ්දිම පදිම වාක්‍ය යන අංශ වලට ද දෙමළ භාෂාව බලපෑ ඇති බව යි. කෙසේ වුව ද මෙහි දී අපගේ අවධානය යොමු වන්නේ දෙමළ **භාෂාව** සිංහල වාග් කෝෂය කෙරෙහි බලපා තිබෙන්නේ කුමන ආකාරයෙන් ද යන්නයි. හෙවත් උක්ත සාධක පදනම් කොටගෙන දෙමළ වදන්වලින් සිංහල වාක් කෝෂය **පෝෂණය** වී ඇත් ද යන්න යි. එබැවින් එදා මෙදාතුර කාලයෙහි ලියවී ඇති ලේඛනමය සාධක හා භාෂණමය හෙවත් **ව්‍යවහාරගත** සාධක උපයෝගී කරගෙන සිංහල වාක් කෝෂය **දෙමළ** වාක් කෝෂයෙන් පෝෂණය වූයේ ද යන්න මෙතැන් පටන් විමසේ. **අධ්‍යයනයේ** වඩාත් සාර්ථකත්වය සඳහා පහත පරිදි විභේදනය කර විමසීම යෝග්‍ය වෙයි.

i. ජේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදී පිළිවෙළට සකස්කර ලියන්න.
ii. කෝෂීය , මෙදාතුර , මෙතැන් යන පදවල පිළි වෙන වෙන ම ලියන්න.
iii. ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.
    1. යෙදී ඇති නිපාත පද දෙකක් ලියන්න.
    2. මහප්‍රාණ අක්ෂරයක් යෙදී ඇති වචන දෙකක් ලියන්න.
    3. කළ , විභේදනය , යන පද අයත් ව්‍යාකරණ විධි මොනවාද?
iv. අධ්‍යයනය , යෝග්‍ය , අවධානය යන පදවලට විරුද්ධ පද ලියන්න.
v. ඡේදය තුළ ඇති නාම විශේෂණ පද තුනක් ලියන්න.

(ලකුණු 3 × 5 = 15)

08. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. ද්විත්වරූප සන්ධිය
ii. විශේෂණ සමාස
iii. වත් , මත් ප්‍රත්‍ය
iv. අවධි විභක්තිය
v. කාලාර්ථයේ නිපාත

(ලකුණු 5 × 3 = 15)

Education NCP - www.edncp.lk

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 12

# අවසාන වාර පරීක්ෂණය - 2019

## සිංහල - I පත්‍රය

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................ කාලය : පැය 03 යි.

- **පළමුවන ප්‍රශ්නය අතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. (ඔබේ පිළිතුර වර්තමාන ව්‍යවහාර බසින් ලියන්න.)**

01. පහත දැක්වෙන උද්ධෘත අතුරෙන් හතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) නුවණ නැති පියාණන්ගේ සමවාය නපුරු හෙයින් බුදුන් කරා ගොස් වැඳපියන්ට වේව යි දනක් දී පියන්ට වේව යි බණක් අසා පියන්ට වේවයි මේ සොළොස්හවුරුද්දෙන් අටහවුරුද්දක් විතරක් නොවීය. දැන් ළඟට ගොසින් වැඳගන්ට පයත් අවසඟය. වැදහෙත් ව ඔසවා නළල තබා වදින්න අතත් නොනැමෙයි. අනික් කළමනා දෙයකුත් නොපෙනෙයි. සිත පහදවා ගැනීමෙහි අදහස් ලැබෙන බැවින් අයාස නැත. මේ අවස්ථාවට පිළිවන් ව තිබෙන සිත පැහැදවීම කෙරෙමියි සිතා පිළියමට දෙව නැතත් බුදුන් දකින්ට දෙව ඇති බැවින් දැක සිත පහදවා බුදුන් වැඩි ගමන සාර්ථක කළහ. බුදුහුත් බර එසවිය නොහෙස්නවුන්ට ශරීරභාරයම සැහෙන්නා සේ මෝහට මෙවිතරක් ම සැහෙයි "සිතා වදාරාලා ශරීරගත වූ පාණ්ඩු රෝගයට පිළියම් නොලැබ මිය යන මට්ටකුණ්ඩලීට පරලොව දී කාය පීඩා චිත්ත පීඩා නැමති රෝග හට නොගන්නට චිත්ත ප්‍රසාද නැමති පිළියම් කරවා වැඩි සේක.

i. සොළොස්හවුරුද්දෙන් අටහවුරුද්දක් විතර කළ කළ නොහැකි වූයේ මොනවා ද?
ii. මෙහි සඳහන් පරිදි ආයාස නොමැති වූයේ කුමක් සඳහා ද ?
iii. බුදුහුත් මට්ටකුණ්ඩලීට කළ පිළියම කුමක් ද?
iv. සමවාය , අවසඟ යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)

(ආ) එබසට අනුරුද්ධ කුමාරයෝ උපයා කැම නම් කර්මාන්ත නම් ඒ කෙසේ වූ දෙයක් දැයි විචාළහ. බත් ඉපදවීමයයි බෑණෝ කීහ. බත් උපදින්නේ රන්තලියෙන් නොවේදැයී කීහ. මලණ්ඩ රන්තලියෙන් නොවෙයි බත් උපදින්නේ කුඹුරෙනැයි කීහ. එබසට අනුරුද්ධ කුමාරයෝ කුඹරෙන් කෙසේ උපදීදැයි විචාළහ. එවේලෙහි මහානාමයෝ මලණුවන්ට ගිහිගෙයි කරන අනුශාසනා වශයෙන් ආදීනව දක්වන්නා හු මලණ්ඩ බත් උපදවන ලෙස මා අතින් අසව. සී සෑම් නම් සුළං බඳන්නා සේ ඉතා උගහට දෙසක නගුලෙක , වියදඬෙක, පිටවකෙක , බඩවකෙක , නිමුනෙක කෙවිල්ලක

i. බත් උපදිනවා යැයි කියන ස්ථාන දෙකක් ලියන්න ?
ii. බත් උපදින හැටි නිවැරදිව දන්නේ කවුරු ද ?
iii. මෙහි ඇති උපමාවක් දක්වන්න.
iv. නිමුනෙක යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)

(ඇ) එකෙණෙහි තම පියාණන් පිටි පස්සෙහි උන්නා වූ ස්වර්ණතිලකා තොමෝ උද්දාල බ්‍රාහ්මණයා නම් කවුරුන් දැයි විචාරා තෙල හඳපීඨය මත්තෙහි හිඳිනා වූ ඒ බ්‍රාහ්මණයාණෝ යයි කී කල්හි තමාගේ නිලුපුල් පෙති දෙකක් හා සමාන නිර්මල වූ සුනිල් නෙතින් ඔහු බලන්නී කොඳ කුකුළු මෙන් සුදු සිනිඳු දත් පෙළෙහි මනහර සුදු රසින් හින්න වර්ණ වූ අතිරක්ත අධර යුග්මය පොපි දෙවා මද මද සිනා පහළ කෙරෙමින් උද්දාළ බ්‍රාහ්මණය මුහුණ බලා තමා පොරව ගෙන උන් පලස මඳක් පහ කොට ශරීර ප්‍රභා විහිදුවාලුව.

i. ස්වර්ණතිලකා සිටියේ කොහි ද ?
ii. මෙහි ඇති උපමා දෙකක් ලියන්න ?



Education NCP - www.edncp.lk

iii. ස්වර්ණතිලකා උද්දාල බ්‍රාහ්මණයාගේ මුහුණ බලා ඉන් පසුව කළේ කුමක් ද ?

iv. අධර යුග්මය - යන්නට කෙටි විවිරණ සපයන්න.

(ලකුණු 04)

(ඇ) එකල්හි උතුම් ගුණ ඇති පතිවත් වූ ඇගේ සෝකාග්නි වේගය සුවාසුදහසක් යොදුන් උඩ නැගී සක්දෙව් රජුගේ භවනය හුණු කළේ ය. ශක්‍ර දේවේන්ද්‍රයෝ දහසක් නුවණැසින් ලොව බලනුවෝ මේ කාරණය දැක බමුණු වෙසක් ගෙන ඇසිල්ලකින් අවුත් මහබෝසතාණන් ඔත් ගල් මුදුනෙහි පෙනී කෙණ්ඩිකාවෙන් පැන ගෙන බෝසතාණන් ඉසළුහ . එකෙනෙහි විෂ නැසී වනය සුවව කොතන විදි බවත් නොදත හැකි විය. මහා බෝසත් එවිට අනුන්ට වෙසෙන්නට මළ වෙස් ලා වැදහොත් එකෙකු පරිද්දෙන් වහා සුවපත් වූයේ ය. චන්ද්‍රිකාවද එ සඳ සුවපත් ව සිටී ප්‍රිය ස්වාමි දැක බලවත් වූ සොම්නසට පැමිණ ස්වාමිනි යම්බදු නුඹ වහන්සේ මාගේ ප්‍රියකල් වූ ඇග අමාපැන් ඉස නිදුක් කොට මාගේ කළ කම් දුරු කොට ප්‍රිය වූ අප දෙදෙනා සමඟ කළ සේක් ද එසේ නුඹ වහන්සේගේ ශ්‍රී පාදය වඳිම් වැද හොත්තීය ඒ ශක්‍ර දේවේන්ද්‍රයෝ ද උන් දැක බලවත් වූ සොම්නසට පැමිණ මෙතැන්හි නොවසව පර්වතයෙන් බැස මිනිස්සුන්ට විසය තැන වෙසෙත්වයි අවවාද කොට තමන්ගේ දිව්‍ය ලෝකයට ගියහ.

i. ශක්‍ර දේවේන්ද්‍රයෝ ගල් මුදුනෙහි පෙනී සිට කළේ කුමක් ද?

ii. විෂ නැසී වනය සුව වූ ආකාරය දක්වා ඇත්තේ කෙසේ ද?

iii. ශක්‍ර දේවේන්ද්‍රයෝ දුන් අවවාදය කුමක් ද?

iv. සුවාසුදහසක් , ඇසිල්ලක් යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)

(ඉ)

| | |
|---|---|
| මෙලෙසින් නොයෙක් | වර |
| දෙමව්පිය කී | මෙහෙවර |
| නො කළ හොත් | අනදර |
| වෙති යි ඔහුගේ නුගුණ නො | සමර |
| | |
| හිමි තම නැණ | නැවින් |
| සැදි ගී තරග | බෙහෙවින් |
| වෙණ සිප් | මහණවින් |
| කෙළේ ඔහු පරතෙරට | මැනවින් |

i. වෙණ සිප්හි ස්වභාවය කෙසේ ද?

ii. වෙනසිප් මහණවින් යන්නෙහි කාව්‍යාලංකාරය කුමක් ද ?

iii. මෙහි ඔහු යනුවෙන් හැඳින්වෙන්නේ කවුරුන් ද ?

iv. නො සමර යන්නට කෙටි විවිරණ සපයන්න.

(ලකුණු 04)

(ඊ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

i. ස්වාමීනී අපගේ කුලයෙහි ශාක්‍යයෝ නම් ඉතා මානීහ.

ii. තොප හා අප කරන වාද නැත.

iii. මාගේ රථ මැදිරිය ගන රන්මුවාය.

iv. ගෙදර එහෙම පිටින්ම පාලුයි උඹ නැතුව.

v. පංචශිඛය තෝ උකුසුවේසයෙන් මා ඇමූ මස් කැටිය ඩැහැගනුව.

vi. ඒ වුනාට මටත් දැන් පොඩි ප්‍රශ්නයක් මතුවෙලා

vii. මා යවන්ට කැමතිද ඔබ නිරතුරු ඇවිටිලි කරන්නේ

( ලකුණු 3 x 4 = 12 )

02. පහත සඳහන් කවිපෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

සුදට සුදේ මහ ගොඩක් වලාකුළු තරු යට අහසේ දිව යන්නේ.
කවුරුද අක්කේ මේවා හදන්නේ කොහෙ තිබිලද මේ හැටි එන්නේ.

මල්ලි දන්නවද පුංචි පුංචි දෙව් කුමාරියන් පොඩි මල් ගොතලා
යනවා නොවැ මේ බුදු හාමුදුරුවෝ දැකල එන්න රෑ බණ අහලා

වලාකුළේ අර අයිනේ ලස්සන සිනා මුහුණු පෙනෙනව ළපටී
අක්කේ බලන්නකෝ ඇත දැකලා ඇති බුදු හාමුදුරුවො වඩින හැටි

Education NCP - www.edncp.lk

බුදු හාමුදුරුවො සොයා ගන්න බෑ වන දෙව් කුමරියො දුක් වෙනවා
සමනල කන්දේ සිරිපා ඉඹ ඉඹ තාමත් එහෙ මෙහෙ ඇවිදිනවා

ඉතින් අම්මලා නැතිව මොකද මේ තනියම යන්නේ උඩ අහසේ
මටත් යන්න හරි ආසයි අක්කේ වලාකුළක් මත නැග රහසේ

මල්ලි දන්නේ නෑ කුමාරියන්ගේ අම්මලාගේ ආදරෙ පිරිලා
හුළං රැළක් වී යනවා යනවා පරෙස්සමට වටටම එතිලා

වෙසක් පෝයදා හුළඟක් වෙන්නට අම්මට කියනවා හඳපානේ
වලාකුළක් උඩ මාත් නැගීලා යනවා හැම තරුවක් ගානේ.

එතකොට මල්ලිට වෙහෙරක් ගානෙම හඳ එළියේ රන් කොත දැකලා
හඳට යටින් රිංගාගෙන යත හැකි ඔළුව නමාගෙන පහත් වෙලා.

(ලකුණු 12)

03. සද්ධර්මරත්නාවලි කතුවරයා සජීව අවස්ථා නිරූපණයට සමතෙකි. මේ කියමන මට්ටකුණ්ඩලී කතා වස්තුව ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15)

**නැතහොත්**

ජාතක කතා කරුවා සිය කතා තුළින් ධර්මෝපදේශ හා සමාජ උපදෙස් සපයයි. මේ කියමන චන්ද කින්නර ජාතකය ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15)

04. " සද්ධර්මාලංකාර කතුවරයා සිය කතා රසවත්ව ඉදිරිපත් කරයි." ඒ සඳහා භාවිතා කළ රචනොපක්‍රම මොනවාදැයි අදාළ නිර්දිෂ්ට කතාව ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15)

**නැතහොත්**

ඒ ඒ චරිතවල හැසිරීම තාත්විකව ඉදිරිපත් කිරීමට පූජාවලි කතුවරයා සමත්කම් දක්වයි නිර්දිෂ්ට කතා ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

05.

(අ) සිංහල පද්‍ය ඉතිහාසය සම්බන්ධයෙන් කෝට්ටේ යුගය ස්වර්ණමය යුගය ලෙස හඳුන්වන්නේ කවර හේතු නිසා ද?

(ආ) ගුත්තිල කාව්‍ය රසවත් වූයේ කුවරයා භාවිත කළ කාව්‍යාලංකාර නිසාය. උදේණිපුර සැණකෙළිය වර්ණනය ඇසුරෙන් මේ කියමන සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

06. බැද්දේගම නවකතාවේ සාර්ථකත්වයට කතුවරයා භාවිත කළ භාෂාවේ අපූර්වත්වය ද ඉවහල් විය උදාහරණ සහිතව විමසන්න.

(ලකුණු 15)

07. කෙටි කතාකරුවන් සිය කෙටි කතා තුළින් පුද්ගල චරිත ගැඹුරින් විග්‍රහ කරයි. මේ කියමන කෙටි කතා දෙකක් ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15)

08. නූතන පද්‍ය සංග්‍රහයේ එන බොහෝ කවීන් තම අත්දැකීම් අපූර්වාකාරයෙන් ඉදිරිපත් කිරීමට විවිධ කාව්‍ය ආකෘති භාවිත කර ඇත. මේ කියමන නියමිත කවි පන්ති තුනක් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

09. පේමතෝ ජායති සෝකෝ නාට්‍ය චරිත නිරූපණයේ දී කතුවරයා දක්වා ඇති කුසලතාව උද්දාල බමුණාගේ චරිතය ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

Education NCP - www.edncp.lk